

# වලසුන්ගේ වගතුග

**(වන සත්වාරක්ෂක දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ පර්සි ද අල්විස් මහතා ගේ අත්දැකීම් කිහිපයක්.)**

විල්පත්තු අභය භූමියේ නෙලුන්විලෙහි එලිමහන් තැන්නක වූ කුඩා දිය උල්පත තද ඉඩෝරයට සිඳී යන කල්හී පවා දිය බීමට එතැනට ඒමට පුරුද්දක් කරගත් වැලහින්නක් හා පැටවෙක් වූවෝය. දිය බොන මෙම වන සතුන් දෙදෙනාගේ ඡායා රුවක් ගැනීම සඳහා මේ තැන්න මායිම් කරන වනරොදට වී බලා සිටීමට පුරුදුව සිටි මම වරක් ඒ සඳහා අඩි 20 ක් පමණ ඔවුන්ට ලංවීමි. එවන් අවස්ථාවක වරක් ඇගේ හිස සම්පූර්ණයෙන්ම දිය කඩිත්ත තුල විය. ඈ පසුපස ලඟින්ම සිටි පැටවාගේ නෙතට කැමරාව සහිත ආගන්තුකයා දිස්වූයේ ඉබේටමය. වහාම තම මවගේ අවධාරණය මා වෙත යොමු කරනු වස් තම කුඩා හොම්බෙන් මවට අනිමින් කෙඳිරි ගාන්ට විය. මවගේ හිස වහා එසවිනි. මදක් කල්පනාකාරී විය. වියහැකි හදිය තේරුම්ගත් මා නැඟු කෑගැසීම් හඬට, කීපවරක් නැවතී පිටුපස බලමින් ඔවුන් දෙදෙනා වනය දෙසට පසුබසින්නට විය.

වරක් ගැමියකු මී පැණි එකතු කරගෙන වනපාර දිගේ නිවෙස කරා එන අතරමග හුදකලාව සිටි වලසකු මුණගැසී ඇත. වලසා බියකර එලවා දැමීමට ගැමියා නැගූ හඬට වලසා තරමක් ඈත්වූවද, මී පැණි සුවඳ ඌහට ඒ මඟින් යාමට සිත් නොදිනි. ඔහුව ලුහු බැදින්නට පටන්ගත් වලසා එලවීමට නැවතත් කෑගැසූ නමුත් ඒ වන මෘගයා ඔහුව ආක්‍රමණය කිරීමට තරයේ ඉටාගෙන ඇති බව ඒත්තු ගෙන තම පණගලවා ගැනීමට වහා දුවන්නට විය. වලහා තමාට ඉතාමත් ආසන්න බව දැනගත් ඔහු ලඟම තිබූ ගසකට නැග ගන්නවාත් සමගම කෝපාවිෂ්ට වූ වලහාට ගැමියාගේ පාදය සපා කා වනය තුලට පැනයන්නට ඉඩ ලැබිණි.

වලසුන්ගේ හැසිරීම ගැන කරන ලද සාමාන්‍ය නිරීක්ෂණයන් හිදී, අවස්ථාව අනුව ඔවුන් සැලකිය යුතු විවිධත්වයක් පෙන්වන බව පෙනේ. මාගේ පුද්ගලික අත්දැකීම් අනුව වලසුන් තමන්ට අයත් සීමාවන් තුලට ආගන්තුකයින්ගේ ආක්‍රමණය බලවත් සේ පිටුපාන බව පෙනේ, වලසුන් වනයේ සැඟවී සිට, ආගන්තුකයින්ට කඩා පනින බව ඇතමුන්ගේ මතයයි. නමුත් ඇත්තෙන්ම ඔවුන් මිනිසුන් යන මඟින් ඉවත්ව සිටීමට කැමැත්තක් දක්වයි. කෙසේ නමුත් ඔවුන් හදිසියේම මුණගැසෙන අවස්ථාවලදීත්, කිපී හෝ තුවාලවී ඇති විටදීත් සමහරවිට ඉතා සැහැසි විය හැක.

නිර්භය දරුණු වලසකු හදිසියේම මුණගැසුනොත් ඉතාමත් දැඩිලෙස කෙලින්ම සටන් වැදීමට ඌ තීරණය කරනුයේ නිතැතින්මය. එසේ නැතිනම් ඌ බියසුළු සිව් පාවෙකු ලෙස හැසිරේ. ඌ නියතයෙන්ම ප්‍රහාරයකට සූදානම් වන්නේද නැත්නම් මඟහරින්නේද යන්න අයෙකුට ස්ථිරවම නිගමනය කළ හැක්කේ වලසුන් පිළිබඳ තම පලපුරුද්ද අනුවය. වලසා බියසුළු බව දක්වන්නේ නම් ඔබ නිර්භයව ඉදිරියට යනවිට ඌද ඉවත්වී යනු ඇත. නැතහොත් ඔබ මගට ඉඩදී ඌගේ කටයුතු වල පාඩුවේ නියලී සිටිනු ඇත.

කෙසේ නමුත් වලසුන් මග හැරිය යුතු වැදගත් අවස්ථාවන් දෙක, ඔවුන් පැටවුන් සමග සිටින විට හා ගැහැණු සතෙකු සමග ආදරය කරන විටත්ය. ආදරය දක්වන අවස්ථාවලදී ඔවුන් විසින් ඇතිකරන හඬ වනය තුල හොඳින් ප්‍රචාරය වේ.

වරක් අනවසරයෙන් අභය භූමියට ඇතුළුවන්නන් ඇල්ලීම සඳහා සිදීගිය ඇල පතුලක ලැගුම්ගත් අප අළුයම අවදි වූයේ වලසුන්ගේ කෑගැසීම් හඬටය. අපේ කඳවුරට මදක් ඔබ්බෙන් කුඩා දිය කඩිත්තක් වූයෙන් එතැනට වතුර බීමට ඔවුන් එවි යයි අපේක්ෂාවෙන් අපි එතැනට ලංවීමු. ඒ අවට සැඟවීමට සුදුසු ආවරණයක් නොවූයෙන් අප කලේ සිදීගිය ඇල පතුලේ දිගාවී සිටීමයි. වලසුන්ගේ හඬ ක්‍රමයෙන් ආසන්න වන්නට විය. වලසුන් යුවලක් වන රොදින් මතු විය. අප සිතූ අයුරු ඔවුන් ආවේ දියබීමට නොවූ බැවින්, දිය කඩිත්ත නොසලකා ඔවුන් ඇල දිගේ එනු දක්නට ලැබුනි.

ඔවුන් දෙදෙනාගේ හැසිරීමෙන් ඔවුන් ආදරවන්තයින් යුවලක් බව ඔවුන්ට අඩි 40 ක් පමණ ඈතින් සිටි අපට පහසුවෙන් වැටහිණි. අපට මදකුදු සෙලවීමටවත් ඉඩක් නොමැති බව හැඟුනේ එවිටය. ආදරයෙන් එකිනෙකා වැලඳගනිමින් සිටි මොවුන් දෙදෙනා සමහර අවස්ථාවලදී දෙපයින් සිටගෙනද ඉන්නට වූහ.

අභය භූමි ආරක්ෂක බණ්ඩාරත්, මාත් බිම දිගාවී බඩගාමින් ගමන්කරන එම යුවලගේ පින්තූර ගැනීමට සුහුසුළු විය. අප ළඟ ආරක්ෂාවට සැත්තක් පමණද නොවීය. හදිසියේම ඔවුන් අප දුටුවොත් කල යුත්තේ කුමක්දැයි පවා නොදැන සිටියෙමු. මෙවන් අවදානම් තත්ත්වයක සිටි අපගේ මහත් වාසනාවකට වලසුන් යුවල හා අප අතර වූ දිය කඩිත්තට හදිසියේම පැමිණි මුවන් රැලකි. මේ වාසියෙන් ප්‍රයෝජනය ගත් අප මුව රැලට මුවාවී එතැනින් පැනගත්තේ සැලෙන දෙපයින් යුතුවය.

වලසුන් ජෝඩු ගැසීම වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ උතුරු නැගෙනහිර මෝසම් සමය අවසානයේදී හා දකුණු බටහිර මෝසම් සමයේ ආරම්භයේදීත් ය. මෙම කාලයට මාස 7 කට පමණ පසු සාමාන්‍යයෙන් පැටවුන් බිහිවීම සිදුවේ. සිඟිති පැටවා සම්පූර්ණයෙන් ලෝම රහිතය. කිසිවක් නොපෙනෙන අසරණයෙකි. සාමාන්‍යයෙන් වරකට බිහිවන්නේ එක් පැටවකු නමුත් දෙදෙනෙකුද බිහිවන අවස්ථා නොමැත්තේද නොවේ. කිරි උරා බොන සිඟිති පැටවා මී මැස්සන් මෙන් මුමුනන අතර, තම බඩ පිරී තෘප්තිමත් වත්ම ගී හඬද මැඩි කරයි.



LIBRARY
SCHOOL OF AGRICULTURE
KUNDASALE.

බොහෝමයක් සිවුපාවුන් ඇවිදිනුයේ තම පාදවල ඇඟිලි මතය. නමුත් වලසුන් ඒ සඳහා මුළු පාදයම උපයෝගී කරගන්නා හෙයින් ඔවුන් විසින් නිවැරදිව හඳුනාගත හැකි පා සටහන් ඇති කරනු ලැබේ. පසු පාද වලින් ඇතිකරන පැතලි පා සටහන් කුඩා දරුවකුගේ පා සටහන් වලට සමානවේ.

දිනක් මම ආධුනික කැලෑ මුරකරුවන් සතර දෙනෙකු සමඟ විල්පත්තු වනරොද තුල විපරීක්ෂාකාරීව සැරිසරන්නට වීමි. ඔරුගල නම් දියකඩිත්තක් අසළ වූ ගලක සිට ඊට සැතපුම් 5 ක් පමණ ඈතින් තිබෙන මහ ඔරුගල නම් තවත් දිය කඩිත්තක් ආශ්‍රිත ගලක් සොයාගැනීමට උත්සාහ දැරීමි.

එක් උදෑසනක අපි ඔරුගල පසුකර සැතපුම් තුනක් පමණ ගමන් මග පිරික්සමින් යන අතර, දිරාගිය දැවැන්ත ගසක් පාමුල සිට හදිසියේම මතුවූ වලසුන් දෙදෙනෙක් ගොරවමින් අප වෙත ආවේ, සියළුදෙනම භීතියට පත්කරමිනි.

අප හැකිතරම් උස් හඬින් කෑගැසූ අතර, වතුර ගෙනයාමට තිබූ ටින් ද නාද කරන්නට විය. ඔවුන් මොහොතකට ගමන් මගෙහි නැවතිණි. අප බිය දුරුකරගෙන නැවත ගමන් ආරම්භ කලා පමණි. එතැන සිටි වැලහින්නිය අපට ප්‍රහාරයක් එල්ල කිරීමට නැවත දුවඑන බව දිටිමි. වලසා මුලින් සිටි තැන සිටම ඒ දෙස බලා උන්නා පමණි. නැවතත් අපි තදින් කෑගැසීමු. වැලහින්න මෙවරද නැවතුනු නමුත් සිටියේ අපට අඩි 30 ක් පමණ තරම් ආසන්නවය. අපගේ හඬ නැවතුණු විගසම නැවතද ඈ අප වෙත ලංවන්නට විය. මේ අතරතුර මගේ කණ්ඩායමේ අනෙකුත් අයට ඒ අසළ වූ විවෘත පෙදෙසට නිසොල්මනේ යන ලෙස මම අවවාද කලෙමි.

බියෙන් තැතිගත් එක්කෙනෙකු පමණක් මදකුදු ඇත් නොවී මාගේ කරේ එල්ලී සිටින්නට විය. ඔහු ඇගේ එල්ලී සිටගෙනම වලසාගේ හඬට සමාන හඬකින් කෑගසන්නට විය. වැලහින්න අවසන් ප්‍රහාරයට ලෑහැස්ති විය. අපි තවත් කෑගැසීමු. ඇය මදක් නැවතී පසුපස සිට තම සහකරුවා දෙස බැලීය. ඒ අවස්ථාවෙන් ප්‍රයෝජනය ගත් අපි දෙදෙනාද එලිමහනට පැන ගතිමු.

ගමන අවසානයේදී වෙනත් කරදරයක් නොමැතිව නවාතැනට පැමිණිනුන පසු සිදුවූ හදියට හේතුව කල්පනා කරන්නට වීමු. වැලහින්න වඩාත් කෝපවීමට හේතුව, අපගේ පිරිසෙන් බොහෝසෙයින් තැතිගැනුනු ආධුනික මුරකරුගේ වැලහින්නගේ හඬට සමාන කෑගැසීම නිසා බව වැටහිණි. ඔහු ඒ ගැන කියා සිටියේ වලසුන් දුටුවිට ඔවුන් බිය කිරීමට කෑගැසිය යුත්තේ වලසාගේ හඬ යටපත් වන පරිදි ඊට සමාන හඬකින් විය යුතු යයි ඔහු සිතා සිටි බවය. සිදුවූ ඇබැද්දියෙන් ඔහු කෙතරම් තැතිගත්තේද යත් පසුව අප මරදන්කඩුවට පැමිණුනු විගසම අපගේ බලවත් ඇවිටිල්ලද නොතකා ඔහු ඉල්ලා අස්වීමට තීරණය කළේය.

බඩගින්නට වඩා පිපාසය වලසුන්ට දරාගත නොහැක. ඉතා වියලි කාලවලදී පොලොව යට වතුර තිබෙන තැන් සොයා ගැනීමට ඔවුන් දක්ෂය. සමහර විට අඩි 5 - 10 ගැඹුරට වතුර ලැබෙන තෙක් ඔවුන් බිම හාරති. එවැනි තැනක් සොයා ගත් විට අවුරුදු පතා ඔවුන් එතැනට ඒමට සිරිතක් කර ගනිති.

වනයේ සතුන්ගෙන් වලසාට සැලකීමක් දක්වන්නේ දිවියා පමණක් යයි කිව හැක. බොහොමයක් ගතිගුණ වලින් ඔවුන් දෙදෙනා එකිනෙකාට හාත්පසින් වෙනස් වන මුත් එකිනෙකාගේ කටයුතු වලට ඔවුනොවුන් බලපෑම් ඇති නොකරන්නේය. සාමකාමී සහජීවනය මොවුන් දෙදෙනා තුල දකින්නට ලැබේ. වරක් වලසකු ඔබ වලකින් තම පිපාසය සංසිඳවා ගන්නා විටදී අසළ වන රොදින් එතැනට පැමිණි පිපාසිත දිවයකු, පිපාසය සංසිඳුවාගත් වලසා එතැනින් නික්ම යනතෙක් පසෙකට වී බලා සිටියේය.

වලසුන් සාමාන්‍යයෙන් ප්‍රාදේශිකව වසන අතර ඔවුන් තම ජීවිත කාලය තුලදීම එම ප්‍රදේශයෙන් ඉවත්ව නොයේ. වලසාගේ ලෝම කළුය. අවුල් සහිතය. ගොරෝසුය. උර දෙපස හා බෙල්ල පසුපස ලෝම වැඩිපුර ඇත. කන්වලද ලෝම පිරී ඇත. හොම්බ සුදුවන් අළු පැහැයක් ගනී. බෙල්ලට යන්තම් යටින් සුදුපාට පටු තීරයක් දකින්නට ඇත. කැලෑවේදී දෙපයින් සිටින අවස්ථාවල දඩයක්කරුගේ ඉලක්කය වන්නේ මෙම සුදු තීරයයි. ඌගේ තොල් සගල ඝනට හා දිගට නලයක් මෙන් වැඩී ඇත. මෙමගින් ඔවුන් පසේ වසන කුහුඹින් පිලවුන් වැනි සතුන් උරාගනී. පෙර ගාත් දෙකේ නියපොතු අඟල් 3 - 4 ක් පමණ දිගය. මේවා සිදීමටත්, පස හෑරීමටත් උපයෝගී කරගනී. ගැහැණු සතුන් ප්‍රමාණයෙන් පිරිමි සතුන්ට වඩා කුඩා වුවද ඔවුන්ගේ උර දෙපස ලොම් වඩා දිගය. එබැවින් වැලඹින්න කරපිට යන පැටවුන්ට තම මව හොඳින් අල්ලා ගැනීමට ඉඩ සැලසේ.

වලසුන්ගේ හොම්බ ඉතා සංවේදී අවයවයකි. මෙතැන්ට තදින් පහර දුන්විට උන්ට ඉතා වේදනාව ගෙනදේ. තැතිගත් විට හොම්බ පසෙහි ඔබා ගැනීම හෝ පෙරපා දෙකින් වසා ගැනීම කරන්නේ මේ නිසාය. ඔවුන්ගේ ශ්‍රවනය හා දෘෂ්ටිය සාමාන්‍යයෙන් දුර්වලය. ඔවුන් අවට පිරික්සන්නේ බෙහෙවින් ඉවෙනි. ඔවුන් නොනිදා සිටින කාලයෙන් වැඩිපුර ප්‍රමාණයක් ගත කරන්නේ ආහාර සොයා යාම සඳහායි. කුහුඹියන්, වේයන්, මල්, මුල්, පණුවන් සහ මී පැණි වලසුන්ගේ ආහාර වේ. වේයන් කෑමට තද ගිජුකමක් දක්වන වලසුන් වේ හුඹස් සහමුලින්ම බිඳ දමයි. ඔවුන් නලාකාර හොම්බ තුලින් වේයන් උරාගන්නා හඬ පැහැදිලිව ඇසිය හැක.

වලසුන් ආහාරය සඳහා සතුන් නොමරන නමුත් තදින් කුණුවී යන මලකුණුවල පණුවන් උරා ආහාරයට ගනී. ඉතා තද ඉඩෝරය කාලවලදී හුඹස් හෑරීම අපහසු හෙයින් පලු, වීර, අඹ වැනි පලතුරු මත යැපේ.

ඔවුන් මී වදයන් සෙවීමටද සමත්ය. මී වදය ඇත්තේ දිරාගිය ගස් බෙනයක් තුල නම්, එය තම දැත් වලින් දෙපළුකොට මී වදයට සමීපවේ. ගස් මුදුන් වල වූ මී වද යන්ට කිට්ටු වීමට නැත් කිරීමේදී සමහර විට මී වදය ඇවිස්සී මී මැස්සන්ගේ ආක්‍රමණයට ගොදුරුවන අවස්ථා එමටය. එවිට වේදනාවෙන් හඬ නගමින් වනය තුලට පැන යන ඔවුන් මී මැස්සන් සන්සුන් වූ විට නැවත එය ලබා ගැනීමට වෙර දරයි. මී වදයක් ඇති ගස්වල වලසුන්ගේ නියපහරවල් බොහෝ විට දකින්නට ලැබෙන්නේ මේ නිසාය.

("ශ්‍රී ලංකා වයිල්ඩ් ලයිෆ්" නම් සඟරාවෙන් මෙම ලිපිය උපුටා ගන්නා අවස්ථාවේදී හදිසියේම රෝගාතුරවූ පර්සි ද අල්විස් මහතා අප අතරෙන් තුරන් විය. පර්සි ද අල්විස් මහතා ශ්‍රී ලංකාවේ වන සතුන් ගේ ආරක්ෂාව හා අභය භූමි සංවර්ධනය සඳහා මූලිකව කටයුතු කල අයෙක් ලෙස හැඳින්විය හැක. "පර්සි බැඳි වැව" නම් විල්පත්තුව තුල ඔහු විසින් ප්‍රතිසංස්කරණය කරන ලද වැව, එම අභය භූමියට ඔහු විසින් කරන ලද සේවාව දක්වන ලාංජනයක් වැනිය. 1945 දී ප්‍රථමයෙන් ආරක්ෂක නිලධාරියෙකු වශයෙන් වන සත්වාරක්ෂක දෙපාර්තමේන්තුවට බැඳුණු පර්සි ද අල්විස් මහතා මියයන විට, එම දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ ධූරය ඉසිලීය.)